මාතලේ මහානගර සභාව
මාතලේ දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 29 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 28 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 15 දින නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

1.2 මතය
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාතලේ මහානගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) 1985 සිට 2014 වර්ෂය දක්වා ගෙවියයුතු විගණන ගාස්තු රු.215,051 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) වෙනත් ආදායම් සහ ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම් රු.849,540 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයට අදාල රු.278,535 ක වියදම් උපචිත පදනම මත ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ණයහිමියෝ රු. 278,535 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාවේ ආදායම් ලෙස ගිණුම් ගතකළ හැකි එකතු වටිනාකම රු.122,850 ක් වූ බලපත්‍ර ගාස්තු, බදු මුදල් හා වෙනත් ආදායම්, හඳුනාගෙන ගිණුම්වලට ගැලපුම් නොකර තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි.

(ඉ) සභාව සතුව තිබූ ජල සැපයුම් පද්ධතිය 2001 වර්ෂයේදී ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පැවරීමේදී සේවකයන්ට ගෙවා තිබූ රු.80,091 ක සේවක ණය සහ 2004 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවෙකුගෙන් සභාවට ලැබිය යුතු රු.784,420 ක වන්දි මුදල ලෙස එකතුව රු.864,511 ක් ණයගැතියන් යටතේ නොදක්වා අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැති ශේෂය රු.864,511 ක් අඩුවෙන් සහ අත්තිකාරම් ශේෂය රු.864,511 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) 2015 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.53,882ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 04ක් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, වටිනාකම රු.19,173 ක් වූ නිදහස් ආයුර්වේද ඖෂධ තොගයද, ගිණුම්ගතකර නොතිබුණි.

(උ) 2015 වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී වෙන්දේසි කර තිබූ පිරිවැය වටිනාකම වූ රු.1,665,568 ක්වූ වාහන 07 ක සහ පිරිවැය හෝ ගත්මිල හඳුනා නොගත් යතුරුපැදියක සහ යන්ත්‍ර 02ක් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2015 වර්ෂයට අදාල කර්මාන්ත ආධාර වටිනාකම රු.16,822,101ක් හා ප්‍රාග්ධන වියදම රු.27,470,996 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) පිළිසරු ව්‍යාපෘතිය වෙනුවෙන් 2015 වර්ෂයට අදාලව ලැබියයුතු හා ගෙවියයුතු රු.8,200,000ක් ණයගැතියන් සහ ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ණයගැති සහ ණයහිමි ශේෂ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඒ) ඉටුකර නොතිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු. 1,028,685ක් වූ කර්මාන්ත 4ක් ණයහිමියන් තුල දැක්වීම හේතුවෙන් ණයහිමි ශේෂය වැඩියෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්
-------------------------------

මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.319,490,010 ක් වූ ගිණුම් විෂයයන් 5 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වුන ශේෂයන් අතර, වටිනාකම රු.1,119,673ක් අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්
----------------------

2015 වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.57,509,898 ක්වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.4,802,812 ක ශේෂයක්ද ඊට ඇතුළත්ව තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
----------------------

2015 වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම රු.106,467,537 ක්වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.39,133,182 ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම
-------------------------------------

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.113,778,479 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) සභාවේ නාගරික මන්ත්‍රීවරුන් විසින් වාහන දෙකක් අවස්ථා 41කදී කිලෝමීටර් 9196 ක් ධාවනයේ යෙදවීම වෙනුවෙන් ඉන්ධන සඳහා රු.118,435 ක් වැයකර තිබුණු අතර, සභාවේ රාජකාරි කටයුතු වෙනුවෙන් එකී වාහන ධාවනයේ යෙදවූ බවට පිළිගතහැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ | |
| | xxiv පරිච්ඡේදයේ 4.1, 4.2 හා 4.4 වගන්ති | 1999 සිට 2014 වර්ෂය දක්වා කාලය තුල විශ්‍රාම ගන්වා ඇති නිලධාරීන් 132 දෙනෙකුගේ එකතු වටිනාකම රු.553,807ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | 571(2) | - 2008 මාර්තු 28 සිට 2013 දෙසැම්බර් 08 දින දක්වා කාලපරිච්ඡේදයට අදාල එකතු වටිනාකම රු.682,747 ක් වූ විවිධ තැන්පතු ශේෂ 27 ක් සහ සභාව විසින් ඉටුකළ කර්මාන්තවලට අදාලව වර්ෂ 2 ඉක්මවූ වටිනාකම රු.1,206,522 ක් වූ 10%ක රඳවුම් මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දින 180ක අඛණ්ඩ සේවා කාලයක් පැවති බවට සභාවේ පැමිණීමේ ලේඛන, වැටුප් ගෙවීම් විස්තර හා පෞද්ගලික ලිපිගොනු අනුව තහවුරු නොවූ සේවකයින් දෙදෙනෙකුට 2014 නොවැම්බර් 18 දින සිට ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණු අතර 2016 ජූලි වන විට සභා අරමුදලින් වැටුප් ගෙවමින් පැවතුණි. |
| (ඈ) | 2010 මැයි 25 දිනැති අංක 04/2010 හා 2011 නොවැම්බර් 01 දිනැති අංක 04/2011 දරන විශ්‍රාම වැටුප් (සංශෝධන) චක්‍රලේඛ | - සේවකයින් 15 දෙනෙකුට අදාල රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් සභාදායකය වූ රු.974,498ක් වර්ෂ 1 සිට වර්ෂ 7 දක්වා කාලයක් සහ 2015 වර්ෂය තුල පළාත් රාජ්‍ය සේවාවට අන්තර්ග්‍රහනය වූ සේවකයින් 35 දෙනෙකුට අදාල රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් සභාදායකය වූ රු.4,898,065 ක් මාස 01 සිට මාස 10 දක්වා කාලයක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොයවා තැන්පත් ලෙස රඳවාගෙන තිබුණි. |
| (ඉ) | 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන හා 2011 ජූලි 20 දිනැති අංක 02/2011 (සංශෝධන 01) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛවල 4.3 හා 2.2 ඡේද | 2013 වර්ෂයට පෙර සිට පැවත එන රු.16,024,895 ක ගෙවියයුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂයක් පැවතුණි. |

| | |
|---|---|
| (ඊ) 1984 නොවැම්බර්20 දිනැති අංක 1984/19 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 8.1 ඡේදය | - හිඟ වරිපනම් බදු එකතු කිරිම වෙනුවෙන් දිරි දීමනා ලෙස රු.323,106 ක් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව ගෙවා තිබූ අතර, ඒ තුල චක්‍රලේඛයෙන් ආවරණය නොවන නිලධාරීන් 09 දෙනෙකු සඳහා ගෙවූ රු.102,916ක දිරි දීමනා ද ඇතුළත්ව තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,024,503 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,503,620 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,520,883 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක ජංගම අනුපාතය සතුටුදායක මට්ටමක නොපවතින අතර ජංගම වගකීම් පියවීමට තරම් ප්‍රමාණවත් ජංගම වත්කම් සභාව සතුව නොමැති බව ඉන් පෙන්නුම් කෙරේ

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් බදු

2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.24,265,610 ක් වූ අතර මින් 2016 ජූනි 30 දින වන විට තවදුරටත් අයවියයුතුව තිබූ හිඟ වරිපනම් බදු ශේෂය රු.23,308,753 ක් විය.

#### 2.3.2 ජල ගාස්තු

සභාව විසින් පවත්වාගෙන යන ලද ජල සැපයුම් පද්ධතිය 2001 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරන අවස්ථාව වන විට අයවීමට තිබුණු රු.4,802,812 ක හිඟහිටි ජල ගාස්තු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,424,944ක් හා මුද්දර ගාස්තු රු.24,892,330ක් අයවිය යුතුව තිබුණි.

2.3.4 වෙනත් අදායම්

-------------------

සභාවට අයත් කිඩ්ස් පැරඩයිස් ළමා උද්‍යානයේ ක්‍රීඩා උපකරණ සවිකර පවත්වාගෙන යාම හා එම උපකරණ පරිහරණය කිරීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළිවෙලින් රු.2,206,275 ක් රු.1,441,650 ක් හා රු.1,086,825 ක් ලෙස සභාවට ආදායම් ලැබී තිබූ නමුත්, ආදායමේ සීඝ්‍ර පහලයාමක් දක්නට ලැබුණු අතර, සභාව විසින් උද්‍යානයේ ආදායම අඩුවීම පිළිබඳ සමාලෝචනය කර ආදායම් වර්ධනය කර ගැනීමට අවධානය යොමු කර නොතිබුණි.

2.4 අධිභාර

---------

මහානගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) විධිවිධාන ප්‍රකාරව පනවන ලද අධිභාර වලට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට රු.45,861 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 1998 ජූනි 12 සිට 2007 දෙසැම්බර් 13 දක්වා අවස්ථා 27 කදී තැන්පත් කර තිබූ එකතු වටිනාකම රු.123,150 ක් වූ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් අවුරුදු 08 සිට අවුරුදු 15 දක්වා කාලයක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

(ආ) 2015 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.26,598,040 ක් වටිනා යන්ත්‍ර 03 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන තමගාවා නිවාඩු නිකේතනයේ සහ අඹගහමුල වෙළඳ සංකීර්ණයේ සභාවට ඇති නීත්‍යානුකූල අයිතිය පිළිබඳව ඔප්පුවකින් හෝ පැවරුම් නියෝගයක් මඟින් තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි .

(ඈ) 1994 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 15 කදී බාහිර පාර්ශවයන්ට ලබාදී තිබූ රු.209,875 ක අත්තිකාරම් සහ සභාවේ නිලධාරීන්ට 2003 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අවස්ථා 24 කදී ලබාදී තිබූ රු.322,118 ක අත්තිකාරම් 2016 මැයි 31 දින වන විටත්, පියවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, එම ශේෂය තුල එකම නිලධාරියෙකුට රු.3,962 බැගින් අවස්ථා 12 කදී ලබාදුන් රු.47,544 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක්ද පැවතුණි.

(ඉ) 1985 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයකට අදාල විගණන ගාස්තු වටිනාකම වූ රු.3,503,344 ක් 2016 ජූනි වන විටත්, පියවීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ තුල බිල්කළ දින සිට වර්ෂ 2ත් 28 ත් දක්වා කාලයක් ගතව ඇති රු.3,114,737 ක ශේෂයක්ද පැවතුණි.

(ඊ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථානමාරුවීම් ලබා ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවියයුතු රු.505,050 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සභාවේ සේවය කර විශ්‍රාම ගන්වා ඇති කම්කරුවකුගේ 2012 ජනවාරි සිට 2014 මැයි දක්වා කාලයට අදාල රු.87,120 ක විශ්‍රාම වැටුප් ඔහු ඉන්දියාවේ පදිංචියට යාම නිසා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. එම මුදල් ගෙවීමට හෝ සභාවේ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඌ) 2015 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් රු.8,699,455 ක ණය හිමි ශේෂ වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින අතර, ගෙවියයුතු පාර්ශවයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2013 සහ 2014 වර්ෂයන්ට අදාලව ණයහිමියක් යටතේ ගිණුම්ගත කර තිබූ රු.7,605,288 ක් 2016 ජූනි 10 දින වන විටද, නිරවුල් කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 36 (i) උප වගන්තියේ (iii) ඡේදය ප්‍රකාර ජනාධිපතිවරයාගේ ලිඛිත පූර්ව එකඟත්වයක් නොමැතිව මාතලේ මහානගර සභාවට අයත් නාගොල්ල පිහිටි ඉඩම වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 1988 වර්ෂයේදී ටෙන්ඩර් කර බදු දී තිබූ අතර, පළාත් පාලන කොමසාරිස්ගේ 1977 ජනවාරි 12 දිනැති අංක 1977/2 දරන චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් බදු ගිවිසුමකට එළඹීමකින් තොරව ඉඩමේ බිම් කොටස් 11 ක් පුද්ගලයින් 10 දෙනෙකු වෙත එකතු වටිනාකම රු.446,117 ක් වූ මුදලකට ටෙන්ඩර් කර බදු දී තිබුණි. එම බදුකරුවන් 11 න් 09 දෙනෙකුම සැලසුම් අනුමත කර ගැනීමකින් තොරව ඉදිකළ ගොඩනැගිලි සඳහා සභාව මඟින් වරිපනම් අංකද ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, භූමියට අදාල තක්සේරුගත බදු කුලිය හෝ අයකර නොතිබුණි.

3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-----------------------

මාතලේ දුම්රිය බඩු ගබඩාවේ පොදු වෙළඳපලක් ඉදිකිරීම

------------------------------------------------------------

මාතලේ දුම්රිය බඩු ගබඩාවේ ගොඩනැගිල්ල නවීකරණය කර පදික වෙළඳුන් සඳහා පොදු වෙළඳපලක් ලෙස වැඩිදියුණු කිරීම ආරම්භ කිරීමට පෙර එළඹ තිබූ පැරණි බදු ගිවිසුම්වලින් ඉවත්වීමට හා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ නව බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. නගරාධිපතිවරයා නාගරික ලේකම් සහ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් අතර 2013 වර්ෂයේදී එළඹ තිබුණු දින රහිත අවබෝධතා ගිවිසුමේ 11 වගන්තිය ප්‍රකාරව සියළුම ඉදිකිරීම් කටයුතු මාස 12 ක් ඇතුළත නිමකර ගොඩනැගිල්ල පවරා දීමෙන් පසුව අවබෝධතා ගිවිසුම අවලංගු වන බව සඳහන් කර තිබූ නමුත් 13 වගන්තිය ප්‍රකාරව එකී ගිවිසුමේ කාල සීමාව දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2015 දෙසැම්බර් අවසානය වන විටත් ඇස්තමේන්තුවේ රු.1,615,003 ක් වටිනා වැඩ විෂයයන් 10 ක් නිමකර නොතිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන කසල වාරියපොල වත්ත නැමැති ඉඩමට බැහැර කිරීම හේතුවෙන් ප්‍රදේශයේ පදිංචිකරුවන් සභාවට එරෙහිව පවරා තිබූ නඩුව සඳහා 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු ලෙස රු.2,880,728 ක් ගෙවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නඩුව අවසන් වී නොතිබුණි. මෙම ගැටළුවට විසඳුමක් ලෙස කසල කළමනාකරණය සඳහා සභාව සතු සම්පත් ප්‍රයෝජනයට නොගෙන කසල බැහැර කිරීමේ කටයුත්ත 2014 දෙසැම්බර් 31 දින අංක 477 දරන සේවා සැපයීමේ ගිවිසුම යටතේ, පෞද්ගලික ආයතනයකට පවරා තිබූ අතර එම ගිවිසුම අනුව දැනටමත්

සභාව කසල බැහැර කරනු ලබන ස්ථානයට කිසිවිටකත් කසල බැහැර නොකළයුතු වුවත් සභාව කසල බැහැර කර ගැටළුකාරි තත්ත්වයක් පැවති ඉඩමටම එකී ආයතනය විසින්ද කසල බැහැර කර තිබුණි. එසේම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කර තිබියදීත් 2015 වර්ෂය තුල ගිවිසුම්ගත මුළු මුදල වූ රු.5,640,826 ක් අදාල ආයතනයට ගෙවා තිබුණි.

(ආ) UNESCAP ආයතනය විසින් ලබාදුන් රු.4,500,000 ක ප්‍රතිපාදන මත මාතලේ ඩෝල පාරේ පිහිටි කොම්පෝස්ට් අංගනය දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩමක ඉදිකර තිබුණද, එකී ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීමකින් තොරව කොම්පෝස්ට් අංගනය, 2007 මැයි 01 දින සිට 30 අවුරුදු බදු ක්‍රමය යටතේ "සෙවනත" නැමති ආයතනයට කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා බදු දී තිබුණි. අදාල ගිවිසුම අනුව වර්ෂ 05 න් 05ට ගිවිසුම අළුත් කළයුතු වුවත්,වසර 05 ඉක්මවූ පසු ගිවිසුම අළුත් කිරීම හා ගාස්තු සංශෝධනය කිරීම සිදුකර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරුකිරීමෙන් අනතුරුවද, අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 02 කට අදාල රු.2,050,000 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණු අතර, ආදායම් විෂයයන් 07ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර, සියයට 42 සිට සියයට 86 අතර පරාසයක විචලනයක් පැවතුණි.

(ආ) වැය විෂයයන් 46 ක් සඳහා සලසා තිබූ රු.6,455,500 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 79 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය සහ සත්‍ය වියදම අතර සියයට 32 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වැය විෂයයන් 23 ක රු.31,446,159 ක් වූ වියදම් දරා ඇතත්, ඒ සඳහා මහ නගර සභා අඥා පනතේ 216 වගන්තියේ විධිවිධාන අනුව නගරාධිපතිවරයාගේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-------------------------

1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ III වැනි කොටසේ 13 වන වගන්තිය ප්‍රකාරව සභාවේ ස්වාධීන අඛණ්ඩ අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වානොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද සමාලෝචිත වර්ෂය තුල එක් අවස්ථාවකදී පමණක් එකී කමිටු පවත්වා තිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ධාවන තත්ත්වයේ නොපවතින රු.340,000 ක් වටිනා වාහන 02 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට පියවරගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ආරම්භ කර තිබූ බ්ලොක්ගල් ව්‍යාපෘතිය 2013 ජූලි 08 දින සිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති අතර, ඒ සඳහා භාවිතා කළ රු.168,789 ක් වටිනා බ්ලොක්ගල් නිෂ්පාදන යන්ත්‍රයක් අභාවිතව පැවතුණි.

5. පද්ධති හා පාලනය

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය